රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 1/89 (III)

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994 මාර්තු මස 15 වන දින.

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## පළාත් පලාන ආයතන වලට තේරී පත්වන රාජ්‍ය නිලධාරීන්ට නිවාඩු - ආයතන සංග්‍රහයට සංශෝධන

## XXXII පරිච්ඡේදය.

1989.01.05 දිනැති අංක. 1/89 හා 1991.04.23 දිනැති අංක: 1/89(1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලින් සංශෝධනය කරන ලද ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:4 වගන්තිය තවදුරටත් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

> " 2:3:4 ඔහු පළාත් පාලන ආයතනයක සභිකයෙකු ලෙස තෝරා පත් කර ගනු ලැබුවහොත් රජයේ සේවයේ ඔහු දරමින් සිටි තනතුරින් ඉල්ලා අස්වන ලෙස ඔහුට නියම කරනු නොලැබේ. එහෙත් පළාත් පාලන ආයතනයේ රැස්වීම්වලට සහභාගී වීම සඳහා හා එම රැස්වීම් හා අනුබද්ධිත කාර්යයන්හි නියැලීම සඳහා සේවයේ හදිසි අවශ්‍යතාවයන්ට යටත්ව මාසයකට දින 03 ක් වැටුප් සහිත නිවාඩු ඔහුට දිය යුතුය ................"

02. ඒ හැරුණු විට 1991.04.23 දිනැති අංක. 1/89(1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 වන ඡේදයේ සඳහන් සෙසු විධිවිධාන පවත්නා පරිදිම විය යුතුය.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙණිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.